

# නිදිකුම්බා මල

**චිරන්ත ජයසේන**

ඉලුක් මානා පවා නොරඳන
අතැර ගිය මුඩු හේන් මුණාත
විජලනය වී පිපාසාවෙන්
වියළි දෙතොලින් යදී ප්‍රේමය

බිරම් වැසි තරවටුව නොලැබුණ
නියං රකුසා ගිජුව ලෙව කන
ඉරි තැලුන තැනිතලා සූරන
වියළි සුළඟින් දූලි ඉහිරෙත

සිඳුණු උල්පත් කෙවෙනි වල අග
අලුත් කඳුළක පැතුම දල්වන
ලෝකයේ මෑදුම පෙති දරා
කෙලෙස නුඹ පිපුණාද මේ බිම

විසල් වනයක පැතුම පුබුදන
මෙමුඩු බිම නිකලැල්ම සලකුණ
කටුක උල් කටු පොකුරු අතරෙහි
ජීවයේ නව කළල වපුරන...



## මෙතැන තවමත් මම

මලිති විජේසේකර

දුර අවරගිර අග
අහස ගුගුරා හැලුනද
කඳුළු උතුරා ගැලුවද
මෙතැන තවමත් මම

අසෙනි මහා වැසි මැද
කඳුරු දිය ගොඩ ගැලූවද
කැකුළු නටුවෙන් මිදුනද
මෙතැන තවමත් මම

අඳුරට එළිය අරගෙන
නුඹ නෑවිත්ම උන්නද
ඇවිත් කඳුලැලි සින්දද
මෙතැන තවමත් මම

## කවි මත පැල්ලම්

අනුෂ්ක තිලකරත්න

තවරා තිබුණි කවුරුන් හෝ
රතු සායම් පැල්ලමක්
විසල් සුදු කඩදාසියක
වටකුරු අකුරු මත

ඇසුවෙමි කෙනෙකුගෙන්
ලඇයි මේ රතුපාටල
මට වඩා උසින් වූ දෑසකින්
බලා මාදෙස මඳ සිනාවෙන්
පැවසුවා නාඳුනන ඔහු
ලේ තමයි ලේල

කුමට තවරයිද එක එක පැල්ලම්
කවි යනු සුදෝ සුදු පත් මත
වටකුරු අකුරෙන් ණන ලළ ගලපා ලියා
ගුරුතුමීගෙන් හරියක් දමා ගන්නා දෙයක් මිස

බොහෝ කලකට පසුව දැන ගතිමි
තැවරෙන බව කවි මත පැල්ලම්
සායමෙන් නොව සැබෑ උණුසුම්
මිනිස් ලෙයින්ම

## ITS WHAT YOU MAKE OF IT

Timeless as the blue of the sky-
The green of the breathing leaves,
Ancient, as the pain in the eyes-
The lines on the face that grieves.

Beauty that dances in the eye
And the truth you wouldn't compare,
Shall collapse on the weight of a sigh-
Such inconsequential fare!

Where the moment expands to amplify sharp sorrow
And makes you despair of a worse tomorrow,
Would serve in equal measure
By stretching some singular pleasure,
To assert a great impartiality.
So would it contract,
Mind ordained,
The stable joy or sorrow of a long day,
To a quick,fleeting abstraction.

This human legacy of mind play
Is yours and mine
And what you make of life,
Is of your own wilful design.

So…..
The sky will always remain blue
And the living leaves, green!

**Chandra Wickramasinghe**

## දෑකැති සඳ

තුෂාරි ප්‍රියංගිකා

සංසාර සඳම්ණක දියකඳ
පිංසාර බඳුනකට අවැසි නැති තැන
රිදුණු ගඟ දිය
නංවා සරැළි දෙබෑ කර වැළපෙයි
අනන්ත නිම්තෙර අග දි හමුවෙයි

අතුල් පහරින් දමා ගැසු
කොපුල තව තව රිදෙනු දැන
දෙ තොල පිපිරෙන සිනහා සයුරත
බිඳී යයි පෙණ කැටිති පණ ඉස
ඉසව්වක අර කුළුණකට යට

පැලී ගිය හද පාළු කරලන
අරලියා මල් පවා ඇහැරුණ
දැවුණු දහවල අහස අග්ගිහ
වැටකෙයා වැට දිගේ ඇවිදින්
පිහ දමන්නද උනන දහදිය

අලූත් අකුරක අලූත් හැඩයට
ඇහිදින්න ගෙල පොටට ගෙත්තම්
ඉකි ගසාලන මෙර බදා ගෙන
මොර ගගාලන කඳුළු කිණිත්තක්
අසල් වන්නට නැති පුරුද්දක්

දෑකැති සඳ
බැස යන්නට දඟළන ඇසිල්ලෙම
මන්දාරම් වැහි ඉහෙයි හෙම්හිට
අළු පෑයෙන් නැගි ඉරිසියාකාර මේකුළු
ඇබිත්තන් ඉරු රැස් මුවාවෙන් හිනැහේ

පාරමිතාවක් නො වන්නට
බෝ පත් සිහිල් සෙවණක
දුල් හැඟුම් කලතාලන දිය දහර
විසුල සත් පියුම් පිපී පර වෙයි
කිරි වෙහෙර ළය පැලී ඉහිරෙයි

හීන දකින ඇස් යට
හීන් කඳුළක් උපදින කොට
තෙතබරියන් වෙන ප්‍රේමය
නූස්සන ඉසකට
බරට අඩි තියා තුරුපත් මත
ඇවිදින්න පුළුවනිද නො රිදෙන්න

මිටියාවත පුරා ලිහෙන කළුවර
කිරිල්ලක නමට ලියා ඇති පෙර දිනෙක
ඉඳුවර නැතත් ඉඳහිට
තුඩ බිඳුණු පන්හිඳක් තිබෙයි තනිවට
ලෙහී ගිය කව් කුමුදට
දෑකැති සඳේ මුදුනත

## පහන් වැට

### ස්තුතියි තාත්තේ, සංසාරය පුරාවට

තිළිනා වීරසිංහ

ලා කහ පැහැති වට්ටක්කා මල් පිපුණු
අලුයම තුෂර පිනි මත
නුඹ මට දායද කළ... සිඟිති ගෙම්දුලෙහි
ඇඟිලි තුඩු මතින් දිව යම් මම
ඔබ උරුම කර ගිය අපමණ දෑ අතරට

සියොතුන්ට ලෙහෙනුන්ට බත් හුළු දන්දෙමින්
අයාලේ යන සතුන්ගේ පිපාසය සංසිඳුවන
පැන් බඳුන් පුරවමින්..
සුදෝ සුදු වතු සුදු මල් දෝත දරා
මා පිටව යන පෙරමග... හොරැහින් බලමින්
දවසැරඹූ නුඹ නැති කඩුල්ල පාළුය

මුළු ගම්මානයම නිසලව වැලපේ තවම
ගම්මානයටම ආදර,ය පියකු වූ බව නුඹ
මගේ හද පතුලට දැනුනේ
නුඹේ මලගම දා ගම්මානයේ දෝරේ ගලා ගිය
ආදරයේ කඳුළැලි අතරිනි.

සැඳෑ අඳුරේ ඇදී යන සුදු වෑන් රියකින් තැති ගැනී
දොරගුලු ලා මා රැකගන්න අපරිමිත වෙර දැරූ
ආදරණීය තාත්තේ
නුඹට අවැසි තරමට
කීකරු නොවූ මේ හිතුවක්කාරිය වෙනුවෙන්
හද පතුලේ වූ ආදර,ය ආඩම්බරය
මහ මෙරක් වූ ලෙන්ගතු කම
අප දෙදෙනා හැර අන් කවුරු දන්නෙද?

නුඹ මා අතැර ගොස් නැත
නුඹ සිටී පැතිරී මගේ දිවිය පුරාවට
මා වෙත ස්නේහයේ නෙතු හයාගෙන
මිනිස්කමෙහි අරුත් පමණක්ම සොයා යාමට
මරණයට එරෙහිව ජීවිතය පුදන්නට
දියණියක බිහිකර ලොවට දන් දුන්නාට
බොහොම ස්තුතියි තාත්තේ
සංසාරය පුරාවට

## අපේ උරුමය

### තේරවිලි කවි

1
ගෙයින් ගන්න ගෙඩියේ නම  දන්නවද
හිරෙන් ගන්න ගෙඩියේ නම  දන්නවද
රටෙන් ගන්න ගෙඩියේ නම  දන්නවද
පිස්සි වැටෙන ගෙඩියේ නම  දන්නවද

ගෙයින් ගන්න ගෙඩියේ නම  කළගෙඩිය
හිදෙන් ගන්න ගෙඩියේ නම  වංගෙඩිය
රටෙන් ගන්න ගෙඩියේ නම  හක් ගෙඩිය
පිස්සි වැටෙන ගෙඩියේ නම  රහු ගෙඩිය

02.
දරුවන් විසිදෙනයි එක මුව දෙනගෙ  බඩේ
සුරවත් විලා ඉස්සර පිට නටන  රගේ
පුරවන්කාර ගුරුවරයිනට මයි  හොඳේ
ඉස් ඇන හිටපු දරුවන් තොරන්නේ  බඩේ

(රහුපටිය)

03.
බීමෙන් හොඳ බීම සකි නුඹ  දන්නවද
දීමෙන් හොඳ දීම සකි නුඹ  දන්නවද
බානෙන් හොඳ බාන සකි නුඹ  දන්නවද
යාමෙන් හොඳ යාම සකි නුඹ  දන්නවද

බීමෙන් හොඳ බීම දෙතනේ කිරි  බීම
දීමෙන් හොඳ දීම සතහට පින්  දීම
බානෙන් හොඳ බාන කරබාගෙන  ඉදුම
යාමෙන් හොඳ යාම සසරෙන් ගොඩ  යාම

04.
වනලා තිබ්නි මානෙල් මල්  යහනේ
නෙලලා තිබුනි සපුමල් පෙති  ගනනේ
නැට්ටත් කොළ පොතුත් තුඩුවක් නැත  යහනේ
තෝරාපන් බෑන මව කී සිත්  නානේ

සැබෑත් සැබෑත් අපෙ මාමා කී  නාමේ
ගේන් නොබැස ඉඳ කීමේ සිත්  නාමේ
අහස උඩ බැලිම් බැබලෙයි පෙර  යාමේ
පාන් කාරකාවට කීවද  මාමේ

05.
එනවා නේනවා තෝරා කියන්  මට
ලුසී කඩේ කඩ යකඩේකියන්  මට
පංච නෙළුම් මල තෝරා කියන්  මට
ලුසී පුරුෂයා තෝරා කියන්  මට

එනවා නේනවා වානේ  නොවේදෝ
ලුසී කඩේ කඩ යකඩේ  නොවේදෝ
පංච නෙළුම් මල කම්මල  නොවේදෝ
ලුසී පුරුෂයා කැති මිට  නොවේදෝ

06
උසැති සැබැයි උස තුන් රියනක්  පමනකි
ගසක් සැබැයි බෙදුනේ කළන්  සතරකි
මයිල දඹදිවට පෙනුනේය රජ  වෙති
තෝරාපන් මිතුර බිම ඇල වුනේ  නැත

(හිසකේ)

07.
තලේ නම් තලේ සති නුඹ  දන්නවද
තලේ නම් තලේ සති නුඹ  දන්නවද
තලේ නම් තලේ සති නුඹ  දන්නවද
තලේ නම් තලේ සති නුඹ  දන්නවද

තලේ නම් තලේ වල් කොටන  කැති තලේ
තලේ නම් තලේ උඩ විදින  ඊ තලේ
තලේ නම් තලේ ගොන් දුවන  මං තලේ
තලේ නම් තලේ තව එපිට  මා තලේ

වී.ජී. මිගෙල් (සරත්)
අංක 12
හිදිකිවිල
මොනරාගල